පළාත්අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල

පෙබරවාරි 04 සතිය

විෂය - චිත්‍ර

ශ්‍රේණිය - 9

සැකසුම - එල්. මහේෂ් විජේවර්ධන
පාසල - ර/නිවි/කරවිට මධ්‍ය විද්‍යාලය

නිපුණතාව :-දේශීය විදේශීය ඓතිහාසික චිත්‍ර, මූර්ති, කැටයම් හා ශෘහ නිර්මාණ කලාවන් හා අනන්‍යතා හඳුනාගෙන ඒවායේ කලා ලක්ෂණ නිර්මාණ කරණයේදී භාවිතයට ගනියි.

නිපුණතා මට්ටම :-ඓතිහාසික ශෘහ නිර්මාණ ආශ්‍රිත කලා අංග අධ්‍යනය කරයි.

ක්‍රියාකාරකම :- "පියගැට පෙළ හා කොරවක්ගල අගයමු"

පැවරුම :- පහත කියවීම් පත්‍රිකාව කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

**කොරවක් ගල**

- පූජනීය ස්ථානයකට හෝ ගොඩනැගිල්ලකට පිවිසෙන පඩි පෙළ දෙපස අත්වැලක් සේ යෙදූ සුවිසල් ගල් පුවරු දෙක කොරවක් ගල නමින් හැඳින්වේ.
- කොරවක් ගල, මකර කටකින් විහිදී ගිය ඇත් සොඬක්, දිය රලක්, ගිනිසිළුවක් ආකාරයෙන් නිමවා ඇත.
- මකර කට තුළින් විහිදී යන රිද්මානුකූල දිය රැල්ලක (ඇත් සොඬ - ගිනිසිළුව) සියුම් ව කැටයම් කර ඇති අයුරින් අගනා කලා නිර්මාණයක් බවට පත් ව ඇත.
- කොරවක්ගලේ කැටයම් සඳහා සිංහ රූප, මකර රූප, ගජසිංහ රූප, කාන්තා රූප යනාදිය භාවිත කර ඇත.
- අනුරාධපුර, පොළොන්නරු යුගවල දී කළුගලින් නිර්මිත කොරවක් ගල ගම්පොළ මහනුවර යුගවල දී ගඩොළු බදාම භාවිතයෙන් නිමවා ඇත.
- අනුරාධපුර, පොළොන්නරු යුගවල දී කොරවක් ගලින් මකර සංකල්පය නිරූපණය වූ අතර මහනුවර, ගම්පොළ යුගවල දී ගජසිංහ සංකල්පයට හැරුණු බවක් පෙනේ.
- පඩි පෙළේ පඩි ප්‍රමාණයට ගැළපෙන පරිදි කොරවක් ගලේ දිග පළල තීරණය විය.

**විවිධ අවධි අනුව කලාත්මක අතින් උසස් කොරවක් ගල් නිර්මාණ**

**අනුරාධපුර යුගය**
- රත්නප්‍රාසාදයේ කොරවක් ගල

**පොළොන්නරු යුගය**
- පොළොන්නරු වටදා ගේ කොරවක් ගල්

**ගම්පොළ යුගය**
- ගඩලාදෙණිය විහාරයේ කොරවක් ගල


රත්නප්‍රාසාදයේ කොරවක් ගල


පොළොන්නරු වටදා ගේ කොරවක් ගල


ගඩලාදෙණිය විහාරයේ කොරවක් ගල

**පියගැට පෙළ**

- පහළ මළුවකින් ඉහළ මළුවකට නැගීම සඳහා ඇති මාර්ගයක ඇති අවශ්‍ය ම අංගය පඩි පෙළ හෙවත් පියගැට පෙළ යි.
- සඳකඩ පහණ, මුරගල, කොරවක් ගල, යන අංග එකිනෙකින් සම්බන්ධ කරන අංගයක් වශයෙන් පියගැට පෙළ හඳුන්වා දිය හැකි ය.
- මුල්කාලීන ව කැටයම් රහිත ව නිර්මාණය වූ පියගැට පෙළ පසු ව විසිතුරු මෝස්තරවලින් අලංකාර විය.
- පඩි පෙළ නැගීමට සඳකඩ පහණ වෙත පැමිණෙන්නකුට පියගැටවල ඉදිරිපස මැනවින් දර්ශනය වේ. එම නිසා එම ඉඩකඩ කැටයම් සඳහා භාවිත කොට තිබේ.
- වාමන රූප, වජ්‍ර සංකේත, පලාපෙති, ලියවැල් ආදිය පියගැට පෙළ අලංකාරයට යොදා ගෙන ඇත.
- අනුරාධපුර බිසෝ මාළිගයේ පියගැට පෙළ වජ්‍ර හා වාමන රූපවලින් සරසා තිබේ.
- පොළොන්නරු වටදාගෙයි පියගැට පෙළ සමීප පෙළට සිටින වාමන රූප රාශියක් දක්නට ලැබේ.
- විෂ්ණු දේවාලයයේ පියගැට පෙළ විවිධ ලියවැල් මල් මෝස්තරවලින් අලංකාර කර තිබේ.
- ශ්‍රී ලංකාවේ තිබෙන මෙම විශිෂ්ට කැටයම් සහිත පියගැට පෙළ සහිත නිර්මාණ කළුගල් මාධයෙන් නිම කර ඇත.


අනුරාධපුර බිසෝ මාළිගයේ පියගැට පෙළ


පොළොන්නරු වටදාගෙයි පියගැට පෙළ


මහනුවර විෂ්ණු දේවාලයයේ පියගැට පෙළ

ප්‍රශ්නः-

1. කොරවග්ගල යනු හඳුන්වන්න.

2. පියගැට පිළිබඳ කලාත්මක කෙටි විස්තරයක් ලියන්න.

3. වැදගත්ම කොරවක්ගල හා පිය ගැට පෙළ පිහිටි ස්ථාන වෙන වෙනම නම් කරන්න.

.4. ඉහත සටහන කියවා වැදගත් කරුණු ඉස්මතු කරමින් කෙටි සටහනක් නිර්මාණය කර රූප සටහන් සමඟ සටහන් පොතේ ලියන්න.